# සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

# රැකියා අවස්ථා

සීමාසහිත ලංකා විදුලි පෞද්ගලික සමාගම යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බෙදාහැරීමේ උපයෝගිතා ආයතනයක් වන අතර, මීගමුව සිට ගාල්ල දක්වා දිවයිනේ වෙරළ තීරයේ මෙහෙයුම් ප්‍රදේශ ආවරණය කරමින්, පාරිභෝගිකයන් 500,000 කට වැඩි ප්‍රමාණයක් සඳහා සේවා සපයනු ලබන අතර, කාර්ය මණ්ඩල සේවකයන් ප්‍රමාණය 1500 ක් වේ. ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. ජ්‍යෙෂ්ඨ මූල්‍ය ගණකාධිකාරී

| | |
|---|---|
| අධ්‍යාපනික සුදුසුකම් | ගණකාධිකරණ මූල්‍ය ගෞරව උපාධියක් හෝ මූල්‍ය විශේෂඥතාවයේ උපාධියක් |
| වෘත්තීය සුදුසුකම් | කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) සාමාජිකත්වය, හෝ<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) සාමාජිකත්වය,<br>වරලත් සහතිකලත් ගණකාධිකාරී සංගමයේ (ACCA) සාමාජිකත්වය |
| වෙනත් සුදුසුකම් | ව්‍යාපාර පරිපාලන විද්‍යාපති (MBA) උපාධිය සතුවීම අමතර වාසිදායක වනු ඇත. |
| පළපුරුද්ද | උපාධියක් ලබාගැනීමෙන් පසු, වගකිව යුතු තනතුරක වසර දහයක (10) සත්‍යාර් කළ පළපුරුද්ද.<br>උපයෝගිතා කර්මාන්ත ක්ෂේත්‍රයේ විශාල සංවිධානයක පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාව. |

## 2. මූල්‍ය ගණකාධිකාරී

| | |
|---|---|
| සුදුසුකම් හා පළපුරුද්ද | * ගණකාධිකරණ/ මූල්‍ය කළමනාකරණ/ B.Com / ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ගෞරව උපාධියක් සමග ICASL / CIMA/ ACCA ආයතනයන්හි අන්තර් මධ්‍ය විභාගය සමත් වීම,<br>සහ<br>සුදුසුකම් ලැබීමෙන් පසු, සේවක සංඛ්‍යාව 100 ඉක්මවන ආයතනයක වගකිව යුතු තනතුරක, ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ වසර 08 ක පළපුරුද්ද,<br>හෝ<br>* ICASL / CIMA/ ACCA ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සමග ගණකාධිකරණ / මූල්‍ය කළමනාකරණ / B.Com/ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ගෞරව උපාධියක්.<br>සහ<br>සුදුසුකම් ලැබීමෙන් පසු, සේවක සංඛ්‍යාව 100 ඉක්මවන ආයතනයක වගකිව යුතු තනතුරක, ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්ද. |

## 3. ගණකාධිකාරී

| | |
|---|---|
| සුදුසුකම් හා පළපුරුද්ද | * ගණකාධිකරණ/ මූල්‍ය කළමනාකරණ/ B.Com / ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ගෞරව උපාධියක් සමග ICA / CIMA/ ACCA ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත් වීම,<br>සහ<br>සුදුසුකම් ලැබීමෙන් පසු, සේවක සංඛ්‍යාව 100 ඉක්මවන ආයතනයක වගකිව යුතු තනතුරක, ගිණුම්කරණ/විගණන ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්ද,<br>හෝ<br>* ICASL / CIMA/ ACCA ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය සමග ගණකාධිකරණ / මූල්‍ය කළමනාකරණ / B.Com/ ව්‍යාපාර කළමනාකරණ ක්ෂේත්‍රයක ගෞරව උපාධියක්. |

## 4. ගිණුම් සහකාර

| | |
|---|---|
| අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. (සා/පෙළ) විභාගය සම්මාන සාමාර්ථ පහක් සමග සිංහල/දෙමළ භාෂා, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත්ව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී සමත්ව සිටිය යුතුය.<br>සහ<br>අ.පො.ස. (උ/පෙළ) විභාගය විෂයයන් තුනකින් (එක් වරකදී) සමත්ව සිටිය යුතුය. |
| වෘත්තීය සුදුසුකම් | අයදුම්කරුවන් හට පහත සඳහන් සුදුසුකම් එකක් හෝ වැඩි ගණනක් තිබිය යුතුය :<br>1) වරලත් ගණකාධිකාරී ආයතනයේ අර්ධ සුදුසුකම් :<br>2) කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ අර්ධ සුදුසුකම් :<br>3) පිරිවැය හා සහතිකලත් ගණකාධිකාරී සංගමයේ අර්ධ සුදුසුකම් :<br>4) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අවසන් විභාගය :<br>5) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව :<br>6) ජාත්‍යන්තර පොත් තබන්නන්ගේ සංගමය/පොත් තබන්නන්ගේ සංගමයේ අවසන් විභාගය :<br>7) ගිණුම්කරණ ශිල්පී සංගමයේ අවසන් විභාගය. |
| පළපුරුද්ද | පොදු ලෙජරය හා ණය පාලන ක්‍රියාකාරකම් සම්බන්ධ අදාළ රැකියාවක වසර තුනක (03) පළපුරුද්ද.<br>පරිගණක ගිණුම්කරණ පරිසරයක පළපුරුද්ද |

ඉහත සියලුම තනතුරු සඳහා වයස් සීමාව, 2020.09.21 දිනට අවුරුදු 40 ට අඩු විය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන්හට ආකර්ෂණීය වැටුප් සමග ආන්තික ප්‍රතිලාභ රැසක් හිමිවේ.

ඔබගේ ජීවදත්ත ඇතුළත් විස්තරාත්මක අයදුම්පත්, අදාළ සහතිකවල පිටපත් සහිතව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඇමතුම් දුරකථන අංක සමග පහත සඳහන් අය වෙත, 2020 සැප්තැම්බර් 21 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

ඔබගේ ජීවදත්ත අයදුම්පතෙහි හා එය බහාලූ කවරයෙහි වම් ඉහළ කෙළවරේ, අයදුම්කරනු ලබන තනතුර සඳහන් කරන්න.

LECO

**මානව සම්පත් හා පරිපාලන ප්‍රධානී,**
**සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික ) සමාගම,**
**03 වන මහල, ඒ.එච්. කුරේ ගොඩනැගිල්ල,**
**411, ගාලු පාර, කොළඹ 03.**